// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1255/24 - 2002 සැප්තැම්බර් 26 වැනි බ්‍රහස්පතින්දා - 2002.09.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. - 4/96 II.

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර සහ සාගර සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද විජේසේකර,
ධීවර සහ සාගර සම්පත් අමාත්‍ය.

2002 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2002 පරාක්‍රම සමුද්‍රය ධීවර කළමනාකරණ ප්‍රදේශ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග (මෙහි මින්මතු "ධීවර කළමනාකරණ ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන) මෙහි උපලේඛනයේ විස්තර කරනු ලබන පරාක්‍රම සමුද්‍රය කළමනාකරණ ප්‍රදේශය සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

3. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, යම් බලපත්‍ර දරන්නෙකු වෙත නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රයක "පරාක්‍රම සමුද්‍රය කළමනාකරණ ප්‍රදේශය සඳහා වලංගුවේ". යන පිටසන් කිරීමක් නොමැති නම්, ඒ බලපත්‍ර දරන්නා විසින් ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ ධීවර මෙහෙයුම් කිසිවක නොයෙදිය යුතුය.

4. කිසිම තැනැත්තෙකු විසින් කරමල් දැල් නොවන යම් ධීවර ආම්පන්නයන් ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ භාවිත නොකළ යුතු ය. පරාක්‍රම සමුද්‍රය ධීවර කළමනාකරණ කමිටුව විසින් ජලාශය තුළ යෙදවිය හැකි උපරිම කරමල් දැල් සහ ධීවර යාත්‍රා (ඔරු) සංඛ්‍යාව තීරණය කරනු ලැබිය යුතු ය.

5. කිසිම තැනැත්තෙකු විසින් අඟල් හතරට (මිලි මීටර් 101.6) වඩා අඩු ඇස් සහිත කරමල් දැල් භාවිත නොකළ යුතු අතර, ධීවර යාත්‍රාවක (ඔරුවක) යෙදවිය හැකි කරමල් දැල් කට්ටලයක් පහත දැක්වෙන පරිදි විය යුතු ය ;

(අ) කරමල් දැල් කට්ටලයක උපරිම කරමල් දැල් සංඛ්‍යාව පහකට (05) සීමා විය යුතු ය ; තවද,

(ආ) දැලක දිගෙහි තිබිය යුතු උපරිම දැල් ඇස් සංඛ්‍යාව එක් දහස් පන්සියයකට (1500) නොවැඩි විය යුතු ය.

6.(1) ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ කරමල් දැල් එළීම සහ කරමල් දැල් ගොඩදැමීම, පහත සඳහන් කරනු ලැබ ඇති වේලාවක් තුළ දී හැර, කරනු නොලැබිය යුතු ය :—

කරමල් දැල් එළීම ප.ව. 3.00 සිට ප.ව. 7.30 දක්වා
කරමල් දැල් ගොඩදැමීම පෙ.ව. 4.00 සිට පෙ.ව. 9.00 දක්වා

(2) කිසිම තැනැත්තෙකු විසින් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල දී ධීවර කර්මාන්තයේ යෙදීම සහ කරමල් දැල් එළීම කරනු නොලැබිය යුතු ය.

7. මෙම නියෝග වල —

"ධීවර කළමනාකරණ කමිටුව" යන්නෙන්, 1997 අප්‍රේල් මස 25 වන දින, අංක 972/15, දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 1997 ධීවර කමිටු නියෝග යටතේ පිහිටුවන ලද කමිටුවක් අදහස් වේ.

"බලපත්‍ර දරන්නා" යන්නෙන්, 1996 මිරිදිය ධීවර කළමනාකරණ නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක සන්තකය දරන තැනැත්තා අදහස් වේ ; තවද,

"කරමල් දැල්" යන්නෙන්, ජලයෙහි යම් ගැඹුරක, මතුපිට, ජලය මැද හෝ පතුලෙහි එලූ දැලක් අදහස් වේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පරාක්‍රම සමුද්‍රය හා ඒ ජලාශයට සම්බන්ධ පහත සඳහන් ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාස ආවරණය වන පරිදි පරාක්‍රම සමුද්‍රය ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| 01. | අංක 155 | - | ඇතුමල්පිටිය |
| 02. | අංක 154 | - | සමුද්‍රගම |
| 03. | අංක 155ඒ | - | සිරිසහබෝ පෙදෙස |
| 04. | අංක 157 | - | සිංහ උදාගම |
| 05. | අංක 161 | - | ගනන්ගොල්ල |
| 06. | අංක 164 | - | පරාක්‍රම සමුද්‍රය |
| 07. | අංක 165 | - | අඹන් ගඟ |
| 08. | අංක 166 | - | තලපාගල |
| 09. | අංක 167 | - | පොත්ගුල් පෙදෙස |
| 10. | අංක 171 | - | තෝපාවැව |
| 11. | අංක 172 | - | පොළොන්නරුව නගරය |
| 12. | අංක 199 | - | නිශ්ශංකමල්ලපුර සහ මින්නේරි ගිරිතලේ වනජීවී රක්ෂිතය 1. |

10-247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.